ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# මානව හිමිකම් සංවිධානය
# (සංස්ථාගත කිරීමේ)

**මානව හිමිකම් සංවිධානය සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු තිස්ස අත්තනායක මහතා විසින්
2021 අගෝස්තු මස 03 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 ජූලි මස 20 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

**[61 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 18.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## මානව හිමිකම් සංවිධානය
## (සංස්ථාගත කිරීමේ)

### මානව හිමිකම් සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

''මානව හිමිකම් සංවිධානය'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංවිධානයක් එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී සංවිධානයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් අංක 10, මස්ජිද් පටුමග, ගාලුපාර, කොළඹ 3 හි පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, එකී සංවිධානය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2021 අංක දරන මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

මානව හිමිකම් සංවිධානය සංස්ථාගත කිරීම

**2.** මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු ''සංවිධානය'' යනුවෙන් සඳහන් කරනු ලබන) මානව හිමිකම් සංවිධානයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින්මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු ''සංස්ථාව'' යනුවෙන් සඳහන් කරනු ලබන) මානව හිමිකම් සංවිධානය යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

**3.** සංවිධානය සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) මානව අයිතිවාසිකම්, මානව ශාස්ත්‍ර හා මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා දැනුවත් කිරීම;

(ආ) මානව ශාස්ත්‍ර කටයුතු ක්‍රීඩා හා සමාජ සේවා කටයුතු සම්බන්ධයෙන් අනුග්‍රහ දැක්වීම හා අනුබල දීම;

(ඇ) ස්වභාවික විපත්වල සහ නොහොබිනා මිනිස් ක්‍රියාකාරකම් නිසා විපතට පත් වූ අය වෙනුවෙන් විවිධ සේවාවන් සැලයීමට මැදිහත් වීම;

(ඈ) ජාතික හා අන්තර් ජාතික වශයෙන් ද ආගමික සමාජයීය හා සංස්කෘතික වශයෙන් ද වැදගත් අවස්ථාවල විවිධ උත්සව, වැඩමුළු හා සාකච්ඡා පැවැත්වීම;

(ඉ) නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඊ) සියලු ජාතීන් නියෝජනය වන පරිදි සර්ව ආගමික පූජකතුමන්ලාගේ මග පෙන්වීම යටතේ වූ අනුශාසක මණ්ඩලයක් පවත්වාගෙන යාම;

(උ) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත් පත් සඟරා, සමරු කලාප, වාරසඟරා, කැසට් පටි, සංයුක්ත තැටි, මෘදුකාංග ආදියට දායක වීම සහ ඒවා නිකුත් කිරීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා යෝග්‍ය වෙතැයි සලකනු ලබන වෙනත් සේවා සැලසීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ යම් දේශීය හෝ විදේශීය ආයතන හෝ සංවිධාන සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම; සහ

(එ) ඉහත සඳහන් පරමාර්ථ හෝ ඉන් කීපයක් හෝ මුදුන් පමුණුවා ගැනීමට අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික හෝ විය හැකි වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම

**4.** (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට සහ සංස්ථාවේ තත්කාලයේ පවත්නා රීතිවලට යටත් ව සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන නිලධරයන්ගෙන් හා වෙනත් තැනැත්තන්ගෙන් සමන්විත වූ (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් ධුර දැරුවා වූ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම මණ්ඩලයේ සාමාජිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල**

**5.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාව විසින් දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් හෝ නිර්මාණයන් ඉදි කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට ගැනීමේ සේවයෙහි නියුක්ත කිරීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර වූ හෝ සියලු ක්‍රියා කාරණා සහ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ රීති**

**6.** (1) පහත දැක්වෙන සියලු කාරණා සඳහා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, එක් එක් පන්තියට අයත් සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු, ඔවුන් ඇතුළත් කර ගැනීම, ඔවුන් ඉවත් කිරීම හෝ නෙරපීම හෝ ඔවුන්ගේ ඉල්ලා අස්වීම සහ සාමාජික නාම ලේඛනයක් පවත්වාගෙන යාම;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, සභාවේ නිලධරයන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් ධුරයෙන් ඉවත් කිරීම හෝ ධුර අත් හැරීම සහ සභාවේ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය, සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය;

(ඈ) මණ්ඩලයේ සංස්ථාවේ හෝ යම් අනුකාරක සභාවක රැස්වීම් සඳහා අවශ්‍ය ගණපූරණය හා එම රැස්වීම්වල කටයුතු කරගෙන යා යුතු ආකාරය ද ඇතුළුව රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම පිළිබඳ කාර්ය පටිපාටිය;

(ඉ) සංස්ථාවේ හා මණ්ඩලයේ සාමාජිකත්වය සඳහා සුදුසුකම් සහ නුසුදුසුකම්; සහ

(ඊ) සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සංස්ථාවේ දේපළ පරිපාලනය හා කළමනාකරණය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදන ලැබූ යම් රීතියක් වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම, (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදන ලද ආකාරයට ම එවැනි ම රැස්වීමක දී කළ යුතු ය.

(3) මේ වගන්තිය යටතේ සාදන ලද රීතිවලට සෑම විට ම සංස්ථාවේ සාමාජිකයන් යටත් විය යුතු ය.

(4) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුවම වූ දිනයේ දී බලාත්මක වූ මේ සංවිධානයේ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූලව නොවනතාක් දුරට, මේ වගන්තිය යටතේ සෑදූ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

සාකච්ඡා මාර්ගයෙන් නිරාකරණය කර දීමට බලය පැවරීම

**7.** විධායක අධ්‍යක්ෂක ජනරාල්වරයා හා අධ්‍යක්ෂ සම්බන්ධීකාරක හෝ පත් කරන ලද සාමාජික මහත්ම/මහත්මීන්හට රාජ්‍ය හා රාජ්‍ය නොවන කටයුතු එනම්,

(අ) රාජ්‍ය දෙපාර්තමේන්තුවලට ගොස් අදාළ නිළධාරීන් මුණගැසී යම් ප්‍රශ්නයක් නිරාකරණය කිරීමට ඇත්නම් එය ජනතා සුභසිද්ධිය තකා අදාළ පාර්ශ්වයේ නිළධාරීන් මුණගැසී ප්‍රශ්නය සාකච්ඡා මාර්ගයෙන් නිරාකරණය කර දීමට බලය මෙයින් පැවරේ;

(ආ) ශ්‍රී ලංකාවේ ඕනෑම දිස්ත්‍රික්කයක එම බලප්‍රදේශයකට අයත් පොලිස් ස්ථානයකට ගොස් අසාධාරණයක් සිදුවී ඇත්නම් එය ජනතා සුභසිද්ධිය තකා අදාළ පාර්ශ්වයේ

නිළධාරීන් මුණගැසී සුහදව සාකච්ඡා මාර්ගයෙන් නිරාකරණය කර දීමට බලය මෙයින් පැවරේ; සහ

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ගරු කටයුතු මැති ඇමැතිතුමන්ලා පළාත් සභා මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, රාජ්‍ය ආයතන හා රාජ්‍ය නොවන ආයතන යන සැම තැනකටම ජනතා හිතවාදීව ජනතාවගේ සුභසිද්ධිය තකා එම මහත්ම මහත්මීන්ගෙන් ලැබෙන්නාවූ පැමිණිල්ලක්, ඉල්ලීමක් හෝ යම් කටයුත්තක් වෙනුවෙන් ද ඉහත (අ) යන ඡේදයෙන් සඳහන් වූ පරිදි කටයුතු කිරීමට බලය පැවරේ.

**සංස්ථාවේ අරමුදල**

**8.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය. ත්‍යාග රික්තවරණ, පරිත්‍යාග පැවරුම්, ග්‍රාහක මුදල්, දායක මුදල්, හෝ ගාස්තු කළමනාකරණ මණ්ඩලය විසින් තීරණ කරනු ලබන පරිදි, එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනාවක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කරගෙන යාමේ දී සංස්ථාව විසින් දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපල දැරිය හැකි බව**

**9.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපල බැහැර කිරීමක්, ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපලක් ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය හා හැකියාව ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාවේ තත්කාලීනව බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ, හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම**

**10.** සංස්ථාවේ කිසියම් සාමාජිකයකු ඔහුගෙන් සංස්ථාවට අයවිය යුතු වාර්ෂික දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් මුදලක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා ගෙවීමට යටත් නොවිය යුතු ය.

**11.** සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපලක් ඉතිරි වුවහොත් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට හෝ ආයතනවලට ඒ දේපල දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම ආයතනය හෝ ආයතන කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හැරීමේ දී හෝ ඊට පෙර, සංස්ථාවේ සභාව විසින් තීරණය කළ යුතු ය. විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපල

**12.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. සංස්ථාවේ විගණනය හා ගිණුම්

(2) සංස්ථාව විසින් එහි ආදායම හා වියදම, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් මණ්ඩලය තීරණය කරන පරිදි සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, තැනැත්තෙක්; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

**13.** මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ සභාවේ සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර වුව ද සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේද යන බව

වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම**

**14.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව**

**15.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.